# ශ්‍රීලවියාඉ ක්‍රියා පිළිවෙත

## ශ්‍රීලවියාඉ කාර්යභාරය හා වගකීම:

යුධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය 1949 දෙසැම්බර් මස 12 වන දින පිහිටුවන ලද අතර, එහි ආදර්ශ පාඨය "නිපුණත්වයෙන් රණබිමට". ශ්‍රීලවියාඉ බලකාය යුධ හමුදාව සඳහා වියාඉ සහාය ලබාදීම කරන ලද්දේ කුඩා වැඩපලක් යුධ හමුදා මූලස්ථානයට යාබදව ආරම්භ කිරීමෙන් අනතුරුව එය 1950 සැප්තැම්බර් මස 01 වන දින කොම්පඤ්ඤ වීදියේ මැලේවීදිය වෙත ගෙන යන ලදී.

## ශ්‍රීලවියාඉ කාර්යභාරය:

යුධ හමුදාවේ ඇති ශ්‍රීලවියාඉ වගකීම යටතේ යුධ හමුදා නියෝග අනුව සියලු විදුලි යාන්ත්‍රික ඉලෙක්ට්‍රොනික් හා ආලෝකීය උපකරණයන් මනා ක්‍රියාකාරිත්වයෙන් පවත්වාගෙන යාම ශ්‍රීලවියාඉ කාර්යභාරය වේ.

## ශ්‍රීලවියාඉ වගකීම්:

1. ශ්‍රීලවියාඉ කටයුතු හා ඊට අදාල දේ සැබැඳිව/වාහන උපකරණ නඩත්තුව පිළිබඳව යුධ හමුදාවේ සියලුම ඒකක/ආයතන වෙත අවශ්‍ය උපදෙස් ලබාදීම.
2. නඩත්තුව, අලුත්වැඩියා කිරීමට වැයවන මුදල් සැබැඳිව මුදල් හා අයවැය අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබාදීම.
3. අලුත්වැඩියා කිරීම, නඩත්තුව, පරීක්ෂා කිරීම හා අයෝග්‍ය කිරීම සැබැඳිව නියෝග පැනවීම.
4. ආපදා රථ සහාය ලබාදීම.
5. විදුලි යාන්ත්‍රික ඉලෙක්ට්‍රොනික් ආලෝකීය උපකරණ හා රේඩාර් උපකරණයන්හි අලුත්වැඩියා පරීක්ෂණ නවීකරණය සිදුකිරීම.
6. වියාඉ කාර්මිකයින් හා වෙනත් ඒකක අනුයුක්ත කාර්මිකයින් පුහුණු කිරීම.
7. ශ්‍රීලවියාඉ වගකීම් යටතේ වන සියලු වාහන උපකරණ අයෝග්‍ය කිරීම.
8. අලුත්වැඩියා සඳහා අවශ්‍ය අමතර කොටස් වැයද්‍රව්‍ය ගණනය කර අවශ්‍යතා ඉදිරිපත් කිරීම.
9. වියාඉ ආයුධ උපකරණ අවශ්‍යතා පිළිබඳ සැලසුම් කිරීම.

## අලුත්වැඩියා කිරීමේ පිළිවෙල:

1. **ඒකක මට්ටමේ අලුත්වැඩියාව** :- අවශ්‍ය වූ ඕනෑම වියෙක යාකල කාර්මිකයින් මගින් සිදුකරනු ලබන සුළු අලුත්වැඩියාවන්.
2. **ක්ෂේත්‍ර මට්ටමේ අලුත්වැඩියාව** :- අවුරුද්දකට වරක් හෝ අවශ්‍ය වූ පරිදි ක්ෂේත්‍ර වැඩපල තුලින් සිදුකරන අලුත්වැඩියාව.
3. **මධ්‍යම මට්ටමේ අලුත්වැඩියාව** :- අවුරුදු 03 කට වරක් හෝ කලින් කලට හෝ මූලික වැඩපලක් තුලින් කරන අලුත්වැඩියාව.

## අලුත්වැඩියා කිරීමේ තත්ව:

1. පළමු පෙළ අලුත්වැඩියාව :- ඒකක මට්ටමේ සුළු ක්ෂේත්‍ර අලුත්වැඩියාව
2. දෙවන පෙළ අලුත්වැඩියාව :- ක්ෂේත්‍ර අලුත්වැඩියාව
3. තුන්වන පෙළ අලුත්වැඩියාව :- මධ්‍යම අලුත්වැඩියාව
4. හතරවන පෙළ අලුත්වැඩියාව :- මූලික අලුත්වැඩියාව

## වියාඉ සහාය ලබාගැනීමේදී භාවිතා වන ආකෘතිපත්‍ර

1. **යුආපොදු 07** - වැඩපල ඉල්ලුම් පත්‍රිකාව

   ඒකක/ආයතන මගින් ක්ෂේත්‍ර අලුත්වැඩියාව හා ඊට ඉහල අලුත්වැඩියාවන් අවශ්‍ය වූ විටකදී පිටපත් 07 කින් ඉදිරිපත් කර යුතුයි.

2. **යුආපොදු 34** - ඌණතා වාර්ථාව
වාහන/උපකරණ වැඩපල වෙත භාරදීමේදී ක්ෂේත්‍ර පරීක්ෂණයේදී දැසට පෙනෙන්නට තිබෙන ඌණතා සඳහා අලුත්වැඩියාවන් සිදුකිරීමේදී සොයා ගනු ලබන ඌණතා සඳහා භාවිතා කරනු ලබයි.

3. **යුආපොදු 04** - සියලු සේවා
මෙයින් වාහන/උපකරණ භාරදීමේදී රිසිට්පතක් ලෙස භාවිතා කෙරේ.

4. **යුආපොදු 24** - කැඳවීම් නියෝගය
අදාල ඒකකය වෙත වාහන/උපකරණය අලුත්වැඩියාව සඳහා ඉදිරිපත් කල යුතු දිනය හා වේලාව යවනු ලබන දැන්වීම. මෙම දැන්වීම ලද පසු පහත දේ සමග වාහන/උපකරණ වැඩපල වෙත ඉදිරිපත් කළ යුතුය.

අ. යුපො 01/උපකරණ ලොග් පොත (AB 01)
ආ. කාර්ය බලපත්‍රය (Work Ticket)
ඇ. යතුර
ඈ. ලීටර් 10 - 15 ක පමණ ඉන්ධන

වාහන/උපකරණ ඉදිරිපත් කිරීමේදී පහත දෑ රහිතව ඉදිරිපත් කළ යුතුයි.
අ. අමතර රෝදය
ආ. වයිපර් ආම් සහ බ්ලේඩ්
ඇ. රේඩියෝ වැනි පිටත සවිකල උපකරණ
ඈ. ජැක්, වීල් බ්‍රෂ්, යතුරු කට්ටලය, කණ්නාඩිය, කැනපිය

5. **යුආපොදු 10** - ඇතුලත් කිරීමේ, පිටකිරීමේ වාර්ථාව
වැඩපල වෙත ඇතුලත් කිරීමේදී ඒකක නියෝජිත ඉදිරිපිට මෙම වාර්ථාව පිටපත් 02 කින් සම්පූර්ණ කර එක් පිටපතක් ඒකක නියෝජිත වෙත භාරදෙන අතර, අලුත්වැඩියාව අවසානයේ වාහන/උපකරණය මුදාහැරීමේදී නැවත මෙම පරීක්ෂණය සිදුකෙරේ.

6. **යුආපොදු 33** - නොසලකා හැරීම, නොමනා පාවිච්චි කිරීම හා කැඩුම් බිඳුම් වාර්ථාව.
නොමනා පාවිච්චිය නොසලකා හැරීම් හා කැඩීම් බිඳීම් හේතුවෙන් වාහනයට, උපකරණයට අලාභහානි සිදුවී ඇත්නම් මෙය නගනු අතර, රිය අනතුරුවලදීද භාවිතා වේ.

7. **යුආපොදු 27** - අයෝග්‍ය කිරීමේ සහතිකය
වාහන/උපකරණ අයෝග්‍ය කිරීම සඳහා සහතිකයක් ලෙස භාවිතා කෙරේ.

8. **යුආපොදු 38** - මුදාහැරීමේ දැන්වීම (පත්‍රිකාව)
අලුත්වැඩියාව නිමකර ඇති බවත්, එය රැගෙන යන ලෙසත් දන්වා වැඩපල වෙතින් ඒකකය වෙත යවන සහතිකය.

9. **යුආපොදු 46** - දොරටු අවසරපත්‍රය

<u>වියාඉ වැඩපල තුලදී භාවිතා වන ආකෘතිපත්‍රඃ</u>

1. **ජොබ් රෙජිස්ටර්** - (Job Register)
සියලු වැඩපල යටත්ව ඉදිරිපත් වන යුආපොදු 07 නිඅ වෙතින් අනුමත කිරීමෙන් අනතුරුව ඒ සඳහා වැඩ අංකයන් ලබාදී ඃනැඉ හද* ජොබ් රෙජිස්ටරයේ සටහන් තබනු ලැබේ.

2. **යුආපොදු 26** - වැඩ පත්‍රිකාව
වැඩය ජොබ් රෙජිස්ටරයේ සටහන් තැබීමෙන් අනතුරුව වැඩ පත්‍රිකාව නගනු ලැබේ.

3. **යුආපොදු 23** - බඩුභාහිරාදිය වියදම් වවුචරය
අලුත්වැඩියා සිදුකිරීමට අවශ්‍ය වැයද්‍රව්‍ය කාර්මික ගබඩාව වෙතින් ලබාගැනීම

4. **යුආපොදු 29** - බඩුභාහිරාදිය ඉල්ලුම් කිරීමේ වවුචරය
ශ්‍රීලයුයුබ ගබඩාව වෙතින් අවශ්‍ය අමතර කොටස් ඉල්ලුම් කිරීම

5. **යුආපොදු 58** - මාර්ග ලේබලය
එකම වැඩපල තුලදී අලුත්වැඩියාව වෙනත් අංශයන් වෙත යොමු කිරීමට භාවිතා කෙරේ.

**<u>යුආපොදු 07 ක්‍රියා පිළිවෙත :</u>**

වාහනයක් හෝ උපකරණයක් යම් ආබාධයක් ඇති වූ විට එය යාකල කාර්මිකයෙකුගෙන් හෝ ශ්‍රීලවියාඉ සුළු ආධාරක ඛණ්ඩයකින් ඉටුකර ගත හැක. අදාල අලුත්වැඩියාව එසේ ඉටුකර ගත නොහැකි නම් යුආපොදු 07 පිටපත් 07 කින් නගා යාකල කාර්මිකයාගේ නිර්දේශය සහිතක වියාඉ ක්ෂේත්‍ර වැඩපල වෙත ඉදිරිපත් කල යුතුය. (පොදු 07 නැගීමේදී මීට ප්‍රථම පොදු 07 නගා නොමැත යන්න සඳහන් කල යුතුය) එම අලුත්වැඩියාව වියාඉ ක්ෂේත්‍ර වැඩපල වෙතින් සිදුකළ නොහැකි නම් වැඩ ආරම්භ කරන අතර, මධ්‍යම වැඩපල වෙත ඉදිරිපත් කෙරේ. මධ්‍යම වැඩපල වෙතින් එම අලුත්වැඩියාව සිදුකල නොහැකි නම් එම අලුත්වැඩියාව ආරම්භ කරන අතර, මධ්‍යම වැඩපල වෙතින්ද සිදුකිරීමට නොහැකි නම් මූලික වැඩපල වෙත යුආපොදු 07 ඉදිරිපත් කෙරේ. මූලික වැඩපල වෙත ඉදිරිපත් කරනු ලබන්නේ යුආපොදු 07 හි මුල් පිටපත පමණක් වන අතර, ඉතිරි පිටපත් 06 හා වාහනය/උපකරණය ඒකකය වෙත භාරදෙනු ලැබේ. මූලික වැඩපල වෙත යුආපොදු 07 ලැබීමෙන් අනතුරුව වැඩපලට ඇතුලත් කල හැකි වාහන/උපකරණ සංඛ්‍යාව අනුව වාහන/උපකරණ රැගෙන ආයුතු දිනය, වේලාව දක්වා කැඳවීම් දැන්වීම යවනු ලැබේ.